# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## (කර්මාන්ත අමාත්‍යාංශය)

# ඇබෑර්තු

1969 අංක 36 දරන පනතින් පිහිටුවන ලද කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ කර්මාන්ත දිරිමත් කරලීම, ප්‍රවර්ධන කරලීම හා සංවර්ධනය පිළිබඳ වගකීම පවරනු ලැබූ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය සංවිධානයකි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ - මුදල් තනතුර - (H M1-2)-(තනතුරු 1 යි)**

**රැකියා විස්තරය**

- ✻ මණ්ඩලයේ මූල්‍ය හා සේවා සැපයුම් කාර්යයන් භාරව කටයුතු කිරීම.
- ✻ නිසි අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධති ක්‍රියාත්මක කරලීම හා අධීක්ෂණය
- ✻ මණ්ඩලයේ අයවැය ලේඛනය සහ වාර්ෂික මූල්‍ය සැලසුම් පිළියෙල කිරීම හා අයවැය ලේඛනය අධීක්ෂණය කිරීම.
- ✻ සියලු ගනුදෙනු පිළිබඳව නිසි වාර්තා පවත්වා ගැනීම සහ කාලීන කළමනාකරණ තොරතුරු ලබා දී, මණ්ඩලයේ අවසාන ගිණුම් හා අන්තර් කාලීන ගිණුම් පිළියෙල කිරීම.
- ✻ මණ්ඩලයේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපතිගේ විමසීම්වලට පිළිතුරු සැපයීම සහ 13-7 ඒ හා 14-2 සී වගන්ති යටතේ විගණකාධිපති ගේ වාර්තා කෝප් (COPE) රැස්වීම්වලට ඉදිරිපත් කරනතුරු ඒවාට පිළිතුරු පිළියෙල කිරීම.
- ✻ මණ්ඩලය විසින් කලින් කලට පවරනු ලබන වෙනත් රාජකාරි හෝ කාර්යයන්.
- ✻ අවශ්‍ය විටදී අවශ්‍ය පරිදි මූල්‍ය කරුණු පිළිබඳව සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාර්ගෝපදේශ සැලසීම

**අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, ගිණුම්කරණය/ මුදල්/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ්‍යය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය හෝ ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මාස්ටර්ස් උපාධිය.

හෝ

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL)/ කළමනාකරණ ගණකාධිකාරී (UK) වරලත් ආයතනයේ (CIMA)/ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) පූර්ණ සාමාජිකත්වය

සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : HM 1-2-රු. 81,670-2,270 X 15-115,720/-

**01. පහසුකම් හා ප්‍රතිලාභ**

- ✻ ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම.
- ✻ සේවක හා පවුල ආවරණය කරමින්, වෛද්‍ය වියදම් සඳහා මුදල් ලබාදීම.
- ✻ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2015 සහ 01/2015 (ii) පරිදි HM ප්‍රභේදය සඳහා ප්‍රවාහන පහසුකම් හෝ දීමනා.
- ✻ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05/2017 පරිදි වෘත්තිය දීමනාව.
- ✻ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 02/2022 පරිදි සන්නිවේදන පහසුකම්.
- ✻ වාර්ෂික ප්‍රසාද දීමනා.
- ✻ සහනදායී පොලී අනුපාත මත ආපදා ණය.
- ✻ අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය.

**02 පොදු කොන්දේසි**

01. මෙය මණ්ඩලයේ ස්ථිර තනතුරකි.
02. තනතුරට තෝරාගනු ලබන අයදුම්කරු, සේවකයා විසින් 10% ක් හා මණ්ඩලය විසින් 12% ක් ගෙවන සේවක අර්ථසාධක අරමුදලට (EPF) හිමි කම් ලබයි. ඊට අමතරව සේවක භාරකාර අරමුදලට (ETF) මණ්ඩලයේ 3% ක දායකත්වය ලබා දේ.
03. උප්පැන්න, අධ්‍යාපන, වෘත්තිය පළපුරුද්ද හා අනෙකුත් අදාළ සහතිකවල පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඔබේ ජීව-දත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සහිත අයදුම්පත් 2023-02-28 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.
04. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
05. වයස් සීමාව අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය.
06. ඉහත සඳහන් සියලු අවශ්‍යතාවයන් හා අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.
07. කවරාකාරයේ හෝ අනිසි බලපෑම් කිරීම් නුසුදුසුකමක් ලෙස සැලකේ.

**සභාපති,**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය,**
**615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.**